# ලංකාවේ ක්ෂත්‍රීය කුලය පිළිබඳ විමර්ශනයක්

එස් .යූ විජේසිංහ
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
suw.wijesingha@gmail.com

**සංක්ෂේපය**

ක්‍රි පූ 6 සියවසේ භාරතීය සමාජය තුළ බ්‍රාහ්මණ ,ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්‍ෂුද්‍ර යන චතුර් වර්ණයක් පැවති අතර එකී වර්ණයන් අතරින් ලංකාවේ ද ක්ෂත්‍රිය වර්ණය පැවතියේ ද යන්න විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ.

ප්‍රාථමික මූලාශ්‍රය සැලකිල්ලට ගැනීමේදී ලංකාව ජනාවාස වන්නේ ඉන්දියාවේ සිට පැමිණි ආර්යයන් ගෙන් වන අතර මෙම ආර්ය කණ්ඩායම් අතර ක්ෂත්‍රියන් සිටි බවට සාධක හමුවේ. මෙකල අභිෂේක උත්සවයට ක්ෂත්‍රිය කුමරියක් සිටීම අනිවාර්ය සාධකයක් විය. එමෙන් ම දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ රජු ගේ අභිෂේක උත්සවයට විවිධ ප්‍රදේශයෙන් ක්ෂත්‍රියන් පැමිණි බව සඳහන් වේ .ඔවුන් තමන්ව ආරක්ෂා කරන ලෙසට රජුගෙන් ඉල්ලා සිටි බව දීපවංසයේ සඳහන් වේ .අනෙකුත් ක්ෂත්‍රියන් අනුරාධපුර ක්ෂත්‍රියන් යටතේ සිටිබව පැහැදිලි වේ . බෝධි රෝපණ උත්සවයට චන්දන ග්‍රාමයේ සහ කාචරග්‍රාමයේ ක්ෂත්‍රියන් පැමිණි බව සඳහන් වේ . මේ අනුව ලංකාවේ විවිධ ප්‍රදේශයන් හි ක්ෂත්‍රියන් සිටි බව ගම්‍ය වේ. අනුරාධපුර ක්ෂත්‍රියන් සහ කාචරග්‍රාමයේ ක්ෂත්‍රියන් සාමකාමීව කටයුතු කළ අතර ඇතැම් අවස්ථාවල ඔවුන් අතර ආරවුල් ඇති විය. ශ්‍රී මහා බෝධීන්වහන්සේට උපස්ථාන කිරීමට ක්ෂත්‍රිය කුලයේ පිරිසක් සිටි බවට සඳහන් වේ.

මෙම අධ්‍යයනය සඳහා ශිලා ලේඛන සහ සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගනු ලැබිණ.බොහෝ මූලාශ්‍රයවල ලම්භකර්ණ වංශිකයන් ක්ෂත්‍රියන් ලෙස හැඳින්වුවත් මහාවංසයේ ඔවුන් ක්ෂත්‍රියන් ලෙස හඳුන්වනු නොලැබේ. පසු කාලීනව නිශ්ශලංකමල්ල රජු ගේ ශිලා ලේඛනයන්හි ගොවි කුලයේ ඇත්තන් ලෙස හඳුන්වා ඇත්තේ ක්ෂත්‍රියන් බව සිතිය හැකිය. බොහෝ දෙනෙකුගේ අදහස වන්නේ ලංකාවේ ක්ෂත්‍රිය කුලයක් නොතිබුණ බවට ය. නමුත් ලංකාවේ ක්ෂත්‍රිය කුලයක් දක්නට ලැබුණු අතර එය ඉන්දියාවේ ක්ෂත්‍රිය කුලයට සමාන කළ නොහැක.

**ප්‍රමුඛ පද:- ක්ෂත්‍රියන් ,කුලය, ලංකාව**